00456

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021/2022

අපරාධ නීතිය - LLU4806/LWU2312

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.01.17 වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. "..... අපරාධයක මූලාංගයන් දෙකම එකවිට පැවතිය යුතුය. එමෙන්ම, ප්‍රකට ක්‍රියාවක් නොමැතිව දෝෂී චේතනාවක් පැවති බව ඔප්පු කිරීම හෝ කිසියම් සාපරාධී අදහසකින් හටගත් බව නොපෙනෙන ක්‍රියාවක් හේතුවෙන් වරදකාරිත්වය පැවරීම හෝ සිදුවිය නොහැක. අභිචෝදක පක්ෂය විසින්, එම නිශ්චිත අපරාධය සංයුක්ත වන්නා වූ මූලාංගයන් ද්විත්වයම ඔප්පු කළ යුතුය..."

Per T. Chand J, in *Mohinder Singh* Vs *The State* (AIR 1960 PH135)

ඉහත ප්‍රකාශය අනුසාරයෙන් අපරාධයක සම්පාදක ධාතු පිළිබඳව විවේචනාත්මක ව සාකච්ඡා කරන්න.

උචිත නඩු තීරණ සහ ප්‍රායෝගික උදාහරණ මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

02. විදුර, පුද්ගලික බැංකුවක කණිෂ්ඨ විධායක නිලධාරියෙකි. එක් සිකුරාදා රාත්‍රියක ඔහු සිය මිතුරන් සමග නගරයේ පිහිටි අවන්හලක රාත්‍රී ආහාර ගත්තේ ය. ඔහු ව නිවසට ගෙන ගොස් ඇරලීමට මිතුරන් ඉදිරිපත් වුව ද, විදුර ඒවා ප්‍රතික්ෂේප කරමින් රාත්‍රී 11.30 ට පමණ ත්‍රිරෝද රථයක නැගී අවන්හලින් පිටව ගියේ ය. නගර සීමාවෙන් ඔබ්බෙහි වූ එක් හුදකලා ස්ථානයක දී, තුවක්කුවක් අතැතිව සිටි, ප්‍රදේශයේ නමගිය අපරාධකරුවකු වූ සිරා, ත්‍රිරෝද රථය නවතන ලෙස සංඥා කළේය. විදුර ව ත්‍රිරෝද රථයෙන් පිටතතට ඇදගත් සිරා, තුවක්කුව ඔහුගේ ගෙලට තද කරමින්, ඔහු සතු වටිනා භාණ්ඩ තමා වෙත ලබා නොදුනහොත් ඔහුව මරා දමන බවට තර්ජනය කළේය. භීතියට පත් ත්‍රිරෝද රථයේ

රියැදුරු උදව් ඉල්ලා කෑගසමින් එතැනින් පළා ගියේ ය. සිරා තමාගේ ජීවිතයට හානි කරතැයි අතිශයින් බියට පත් විදුර තමාගේ මුදල් පසුම්බිය, අත් ඔරලෝසුව, සහ රන් අත් පළඳනාව සිරා ට දුන්නේ ය. එම ස්ථානය වෙත පොලිස් මුර සංචාරක කණ්ඩායමක් පැමිණෙන බව දුටු සිරා, රන් අත් පළඳනාව පමණක් රැගෙන පළා ගියේ ය.

ඉහත සිද්ධිය විශ්ලේෂණය කර, ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ අදාල ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් සිරාගේ සාවද්‍ය භාවය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

03. අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් පහත දැක්වෙන ප්‍රකාශයන් විවේචනාත්මක ව සාකච්ඡා කරන්න.

ඇ) ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 77 වන වගන්තිය මැක් නෝටන් රීතිවල හුදු ප්‍රතිබිම්බයක් පමණි.

ආ) කිසියම් ව්‍යවස්ථාවකින් අදාලත්වය ප්‍රකාශිත ව බැහැර කර ඇත්නම් මිස, සිද්ධිය පිළිබඳ වැරදීම රක්ෂණය සියළු වරද කෙරෙහි අදාල වේ යන්න ශ්‍රී ලංකාවේ පිළිගත් තත්ත්වයකි. (ලකුණු 10 x 02 = 20)

04. "…. සියළුම අධිකාරයන් සලකා බැලීමෙන් පසු මාගේ අදහස වන්නේ, අන් අයෙකුගේ සන්තකයෙන් යම් දේපලක් ගැනීම සම්බන්ධ සාපරාධී සාවද්‍ය පරිහරණ චෝදනාවක දී,එම දේපල මුල් අවස්ථාවේ ගැනීම නිර්දෝෂී විය යුතුය. මෙම වරද සොරකම සහ එවැනි වෙනත් වරද වලින් වෙන්කර දක්වන ලක්ෂණය මෙය වේ. මෙම කරුණ වෙනත් ආකාරයකින් සැලකීමෙන් සාපරාධී සාවද්‍ය පරිහරණය යන වරද සොරකම, වංචාව ආදී අනෙකුත් වරදවලින් වෙන් කෙරෙන සීමාවන් අපැහැදිලි කෙරෙනු ඇත. …"

Per Weeramantry J, in *Ranasinghe* Vs. *Wijendra* (1970) 74 NLR 38 at page 43

දේපලක් සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීම යන වරද සම්බන්ධව ශ්‍රී ලංකාවේ නිවැරදි වර්තමාන නීති තත්ත්වය ඉහත ප්‍රකාශය මගින් පිළිබිඹු වේ ද?

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් විවේචනාත්මක ව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

05. නව වසර සැමරීම වෙනුවෙන් පෙරේරා ගේ නිවසේ පැවති සාදයක දී පැමිණ සිටි අමුත්තන්ට ආහාර වර්ග සහ මත්පැන් විශාල ප්‍රමාණයකින් සංග්‍රහ කරන ලදී. සැර මත්පැන් වීදුරු කීපයක් පානය කළ ජෝන්, අනපේක්ෂිත ලෙස තරුණ කාන්තාවකගේ උකුල මතට ඇද වැටුණේ ය. විනීතව හැසිරෙන ලෙසත්, කාන්තාවගෙන් සමාව ගන්නා ලෙසත් පෙරේරා ජෝන් ට තදින් කෑ ගසා කීවේ ය. ජෝන් ද මහ හඬින් කෑ ගසමින් තමා එසේ නොකරන බවත්, හැකිනම් තමාව සාදයෙන් ඉවත් කරන ලෙසත් පෙරේරා ට අභියෝග කළේය. පෙරේරා හිස් මත්පැන් බෝතලයක් ගෙන එය බිඳ, බිඳුනු බෝතලයෙන් ජෝන් ගේ පපුවට පහර දුන්නේ ය. පහරදීම වැළැක්වීමට මැදිහත් වූ තවත් අමුත්තකු වූ සිවා ට ද පෙරේරා පහර දීම නිසා ඔහුගේ උදරය තුවාල විය. ජෝන් සහ සිවා යන දෙදෙනාම රෝහල් ගතකරන ලදී. සිදු වූ තුවාල හේතුවෙන් ජෝන් පසුදින මරණයට පත් විය. සිවා ගේ තුවාල සුව වෙමින් පැවති නිසා දින දහයකට පසු ඔහු රෝහලෙන් පිට වූයේය.

පෙරේරා ට අදාල කරගත හැකි කිසියම් ව්‍යතිරේකයක් පවතී ද යන්න පරීක්ෂා කරමින් පෙරේරා ගේ සාපරාධී වගකීම සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. ගම්පහ නගරයට නුදුරු ප්‍රදේශයක විසූ 23 වියැති චතුර සහ 14 වියැති දූලිනි අසල්වැසියෝ වූහ. චතුර සහ ඔහුගේ බාල සොයුරියන් දෙදෙනා සමග දූලිනිගේ දැඩි මිතුරුකමක් පැවතුණි. එක් ඉරිදාවක චතුර ගේ සොයුරියන් දූලිනිට ඇරයුම් කළේ ගම්පහ නගරයේ සිනමාහලක තිරගත වන නවතම චිත්‍රපටය නැරඹීමට තමන් සමඟ එන ලෙසයි. දූලිනි ඔවුන් සමඟ යැවීමට දූලිනිගේ මව මුලින් ප්‍රතික්ෂේප කළත්, ඔවුන් දිගින් දිගටම ඇවටිලි කළ නිසා පසුව ඇය ඊට අනුමැතිය දුන්නා ය.

දූලිනි ඉතා කැමැත්තෙන් ඔවුන් සමග පිටත් ව ගියේ හැකි තරම් වේලාසනින් ආපසු නිවසට එන බවට පොරොන්දු වෙමිනි. පොරොන්දු වූ පරිදි මහ රෑ වන තුරුත් දූලිනි නිවසට නොපැමිණි නිසා ඇගේ මව ඇය ගැන විමසීමට චතුරගේ නිවසට ගියාය. ඒ වන විට චතුරගේ සොයුරියන් දෙදෙනා එහි සිටි අතර දූලිනි කොහේදැයි විමසූ විට චතුර ගේ සොයුරියන් පැවසුවේ දූලිනි සහ චතුර දෙදෙනාම විවේක කාලයේ දී සිනමාහලෙන් පිටවී ගිය බවයි. තම බාල වයස්කාර දියණිය බලහත්කාරයෙන් රැගෙන යාම සම්බන්ධයෙන් චතුරට විරුද්ධව දූලිනිගේ මව එදින ම පොලිසියට පැමිණිලි කළා ය. දින 03ක ට පසු දූලිනි සහ චතුර මහනුවර ප්‍රදේශයේ ස්ථානයක සිටියදී සොයා ගන්නා ලදී. එහි දී අනාවරණය වූයේ දූලිනිගේ වයස අවුරුදු 18 ක් බව සඳහන් කර, චතුර විසින් විවාහ ලියාපදිංචි කිරීමේ අපේක්ෂාව දන්වා දැන්වීමක් භාර දී ඇති බවයි.

දූලිනි නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම යන වරද සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය යටතේ චතුර ට චෝදනා නැගී ඇත.

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. "... ස්ත්‍රියක් අනුමැතිය දීම යනුවෙන් අදහස් වන්නේ ඇය විසින් ම නිදහසේ අවනත වීමට එකඟ වීමයි. සැමවිට ම ස්වේච්ඡා සහගතව සහ මනා සිහි බුද්ධියෙන් යුක්තව අනෙකා විසින් කිරීමට යෝජනා කළ ක්‍රියාව පිළිගැනීම සහ අනෙකා සමග එම ක්‍රියාවට එකඟතාවය දැක්වීම ඉන් අදහස් කරයි. ලිංගික සංසර්ගය සඳහා අනුමැතිය දීම සහ අවනත වීම අතර වෙනසක් පවතී. සැම අනුමැතිය දීමකම අවනත වීම තිබෙන නමුත් සැම අවනත වීමක ම අනුමැතිය දීමක් නොමැත. තවද, හුදු අවනත වීම අනුමැතිය නොවේ...."

Per J.A.N.de Silva J, in *Inoka Gallage* Vs *Kamal Addararachchi* and Another (2002) 1 SLR 307 at page 311

ඉහත ප්‍රකාශය අනුසාරයෙන්, 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී දූෂණය නැමැති වරද පිළිබඳ නීති තත්ත්වය විවේචනාත්මක ව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන දෑ පිළිබඳ සටහන් ලියන්න.

අ) අපරාධය නැමැති සංකල්පය සහ අපරාධය යන්නෙහි නිර්වචනය කෙරෙහි ඇති විවිධ ප්‍රවේශයන්.

ආ) ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමට සහාය වන විවිධ රාජ්‍ය ආයතන සහ ඒවායේ සුවිශේෂී කාර්ය භාරයන්.

(ලකුණු 10 x 02 = 20)

හිමිකම් ඇවිරිණි.